# 3 නිපාත

නාම පද හා ක්‍රියා පදවලට අමතර ව භාෂාවේ යෙදෙන පද විශේෂයකි, අව්‍යය පද. විභක්ති, ලිංග, කාල වචන වශයෙන් කිසිදු වෙනසකට පත් නොවී එක ම ස්වරූපයෙන් තිබීම අව්‍යය පදවල ලක්‍ෂණය යි. **නිපාත** යනු ඒ අව්‍යය පද අතර එක් කොටසකි.

ප ව් මිස පිනෙකැයි නොකරන හැම කල
මු නි බණ නො පවතිනා පිට සක්වළ
නි සි ලෙස උපනත් ලැබ දන මනකල
කි සි කලෙකත් කුසලක් නො කළැකි බල

පස් පව් කොට මෙ තැනත් ලැබ සෝකය
ගොස් නිරයේ දුක් විඳිති අනේකය
රැස් කොට ඉන් පින් මෙමිනිස් ලෝකය
සිස් නො කරවු කලෙකින් ලත් මේ කය

තැන කින් ගෙන දැමුවත් කැට නුබ කුස
අ ත රක නොරඳන මෙන් මේ බිම මිස
සි ත සතොසින් පින් නො කළොත් නිසි ලෙස
නැත සිටිනා තැන් සතර අපා මිස

ලෝවැඩ සඟරාව

ඉහත කවි පන්තියේ **තද කළු** අකුරින් මුද්‍රිත ව ඇත්තේ **නිපාත** පද යි. ඒවා මුළු රචනාව පුරා විවිධ අර්ථ දෙමින් යෙදී ඇත. වාක්‍යයක මුල, මැද, අග විශේෂයක් නැති ව යෙදෙන (වැටෙන) යන අර්ථයෙන් නිපාත යන නම එම පදවලට ලැබී ඇත.

## නිපාත පදවල ප්‍රයෝජන හඳුනා ගනිමු

1. වාක්‍ය අලංකාරයට

උදා:- **ඉක්බිති** රාහුල තෙරණුවෝ **වනාහි** දෙව්රම් වෙහෙර **බලා** වැඩම කළහ.

2. වාක්‍ය සම්පූර්ණයට

උදා:- දුටුගැමුණු**ත්** පරාක්‍රමබාහු**ත්** විජයබාහු**ත්** පෙර ලක්දිව රජ දරුවෝ ය.

**යෙදෙන අර්ථය අනුව නිපාත පද වර්ග රාශියකි. මෙයින් කිහිපයක් පහත දැක්වේ.**

01. සමුච්චයාර්ථය (පද එක් කිරීමේ අර්ථය)

| | |
|---|---|
| **ද** | - සේනානායක **ද** සේරසිංහ **ද** අශෝකාරාමයට ගියහ. |
| **ත්** | - දායක සභාවේ සභාපතිතුමා**ත්** ලේකම්තුමිය**ත්** ගමනට සහභාගි වූහ. |

02. එක්ව යන අර්ථයේ

| | |
|---|---|
| **සහ** | - දයාපාල **සහ** කරුණාදාස මත්පැනට විරුද්ධ වෙති. |
| **කැටුව** | - බුදුන් වහන්සේ ආනන්ද හිමි **කැටුව** ගිජුකුළු පව්වට වැඩි සේක. |

03. ප්‍රශ්නාර්ථයේ

| | |
|---|---|
| **ද** | - ඔබවහන්සේ වැඩම වන්නේ සැවැත් නුවරට ද? |
| **කෙසේ** | - උත්සාහවත් නොවී විභාග ජය ගන්නේ **කෙසේ** ද? |

04. කාලාර්ථයේ

| | |
|---|---|
| **අද** | - **අද අද** එයි මරු පින් කර ගන්නේ |
| **හෙට/සෙට** | - කෙලෙසද **සෙට** මරු නේති සිතන්නේ |

05. ඛේදර්ථයේ/ භාව සූචනාර්ථයෙහි

| | |
|---|---|
| **අහෝ** | - **අහෝ** ! සසර කරුමෙක මහත |
| **අපොයි** | - **අපොයි** ! මෙවැනි දුකක් නම් නොවේවා ! |
| **හා** | - **හා** ! කොච්චර හොඳ ද ආ එක. |

3.1 ක්‍රියාකාරකම

i. පහත ඡේදයේ ඇති නිපාත පද තෝරා ලියන්න.

**මහ මුහුදටත් කඳුවැටිවලටත් අතර පහත රට තැනිතලා ප්‍රදේශයක පිහිටි ගමකි, බැද්දේගම. ඒ අවටින් වූයේ ඝන කැලෑවකි. මෙසේ කැලෑවට බැද්දට මැදි වී සිටි හෙයින් ඒ ගමට බැද්දේගම යන නම ඉබේ ම ඇති වූවකි. මහමුහුදක් සේ පෙනුණු ගම වටා පිහිටි වන රොද නිසා ඈත උතුරෙන් වූ කඳු වැටි උස් වූ පවුරු බිතක සිරිය ඉඳුරා පළ කළේ ය. උණුසුම් වාතය ද, දූවිලි ද, වියළී පොඩි වී ගිය දඬුපත් ද පිස ගෙන ආ වන ගඳ ගම පුරා පැතිර සිටියේ ය.**

-බැද්දේගම-
-ලෙනාඩ් වුල්ෆ්-

ii. අයුරු, කුමට, අයියෝ, අනිද්දා, නිසා, ගැන, ඒ, සමග, බොහෝ, මෙහි යන නිපාත පද යොදා වාක්‍ය තනන්න.